සැ.යු.- මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

0 8 SEP 2010
සභා ලේකම් කාර්යාලය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,664 - 2010 ජූලි මස 23 වැනි සිකුරාදා - 2010.07.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | පළාත් සභා නිවේදන ... ... ... ... | 1366 |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| | | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


### සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූලි මස 30 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජූලි මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

ලක්ෂමන් ගුණවර්ධන,
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

## සබරගමුව පළාතේ පළාත් සභාවේ 2010 අංක 01 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ :- 2010.05.06
අනුමැතිය ලැබුණේ :- 2010.06.23

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි,

ප්‍රියානී පද්මලතා,
සභා ලේකම් *(වැ.බ.)*
සබරගමුව පළාතේ පළාත් සභාව.

සබරගමුව පළාතේ 2010 අංක 01 දරන අධ්‍යාපන ප්‍රඥප්ති කෙටුම්පත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වැනි උපලේඛනයේ පළමු වැනි ලැයිස්තුවේ දක්වා ඇති ප්‍රමාණයට අධ්‍යාපනය හා අධ්‍යාපන සේවා සහ ඒ සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, සබරගමුව පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙහි ධුරයන් හා එහි කාර්යභාරය නිරණය කිරීම සඳහා ද වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ නීති සංග්‍රහයේ (185 වන අධිකාරය වන) අධ්‍යාපන ආඥාපනතට අනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවන දිනය.

1. මෙම ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 2010 අංක 01 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබන දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

### 1 කොටස

*සබරගමු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා එහි අනෙකුත් ධුරයන්*

සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා අනෙකුත් ධුරයන් පිහිටුවීම

2. රටේ ආර්ථික සහ සමාජයීය අවශ්‍යතාවයන්ට සුදුසු නිර්මාණශීලී කුසලතා ඇති පුරවැසියන් බිහි කිරීම උදෙසා අවශ්‍ය අධ්‍යාපන සේවාවක් සබරගමුව පළාත තුළ ඇති කිරීම හා ක්‍රියාත්මක කිරීම පිණිස සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව තුළ සබරගමුව පළාතේ, පළාත් සභාවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ යන ධුරයන් මෙයින් පිහිටුවනු ලබන්නේ ය.

3. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා 2 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (මෙහි මින්මතු, "අධ්‍යාපන අධ්‍යක්ෂ", යනුවෙන් හඳුන්වනු ලබන) යන නාමය හා අභිධානය යටතේ ධුරය දරන්නා සබරගමුව පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේ ය.

(2) සබරගමුව පළාතේ අමාත්‍ය මණ්ඩලයේ අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ (මෙහි මින්මතු, "අමාත්‍යවරයා", යනුවෙන් හඳුන්වනු ලබන) සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම භාර තැනැත්තා වන්නේය.

(3) මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා ඉහත දෙවැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අධ්‍යාපන අධ්‍යක්ෂ ධුරය සඳහා සුදුසු අයෙකු සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු වන්නේ ය.

(4) මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා ඉහත තුන්වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ යන ධුරයන් සඳහා සුදුසු තැනැත්තන් සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් හෝ ඔහු විසින් බලතල පවරනු ලැබූ අය විසින් පත් කළ යුතු වන්නේ ය.

(5) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මකවන දින වන විට මෙහි නියමිතව සඳහන් සියලු තනතුරු සහ නිලතල දරන සෑම නිලධරයෙකු හා සේවකයෙකුම මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද්දකු සේ සැලකිය යුතු අතර, ඇතුළු ඒ පරිද්දෙන්ම සේවයේ යෙදිය යුතු ය.

4. (1) නියමිත සුදුසුකම් ඇති අය සබරගමුව පළාත තුළ ගුරු සේවයට පත් කිරීම, විනය පාලනය, මාරු කිරීම හා පාසල්වලට විදුහල්පතිවරුන් පත් කිරීම ඇතුළුව අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ වෙනත් නිලධරයන් පත් කිරීම, පරිපාලනය සහ මාරු කිරීම ආණ්ඩුකාරවරයා සතු වන්නේ ය.

නිලධරයන් පත් කිරීම හා මාරු කිරීම.

(2). මෙම වගන්තියේ (1) උපවගන්තිය යටතේ වූ ආණ්ඩුකාරවරයා සතු බලතල විටින් විට තම අභිමතය පරිදි සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ද, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්වරයා, අධ්‍යාපන විෂයය භාර පළාත් අමාත්‍යාංශ ලේකම්වරයා, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හෝ වෙනත් පළාත් රාජ්‍ය සේවය යටතට ගැනෙන අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධරයෙකුට පැවරීම කළ හැක්කේ ය.

5. සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ බලතල හා කාර්යයන් පහත පරිදි වන්නේ ය :-

සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ බලතල හා කාර්යයන්.

(1) සියලුම පළාත් සභා පාසල්, පෙර පාසල් හා අනෙකුත් අධ්‍යාපන ආයතන සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම,

(2) (1) ඡේදයේ සඳහන් සියලුම පළාත් සභා පාසල්, සියලුම පෙර පාසල් හා අනෙකුත් අධ්‍යාපන ආයතන අධීක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීම,

(3) අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම පිළියෙල කිරීම,

(4) වාර්ෂික අධ්‍යාපන සංවර්ධන සැළසුම් ක්‍රියාත්මක කිරීම,

(5) අධ්‍යාපන නිලධරයන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් කළ වැඩ පිළිබඳව කාර්ය සාධන අගැයීම,

(6) (i) සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමෙන් පසු පාසල් හැර යන දරුවන් සඳහා වෘත්තීය පුහුණු හා ව්‍යාපෘති මාර්ගෝපදේශන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම,

(ii) තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව ලැබූ අයට කාර්මික විද්‍යාල, වෘත්තීය තාක්ෂණ ආයතන හා විශ්වවිද්‍යාලය දක්වා උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීමට උපකාර කිරීම, මග පෙන්වීම හා පහසුකම් සැලසීම,

(iii) ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමැතිය ලබා ඇති සේවාස්ථ පුහුණු කිරීමේ වැඩ සටහන් පවත්වාගෙන යාම.

(7) විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද විභාග සහ රජයේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ප්‍රාදේශීය විභාග පැවැත්වීම,

(8) නොවිධිමත් අධ්‍යාපනය පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම,

(9) (i) පෙර පාසල් ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම,

(ii) ජාතික අධ්‍යාපන ආයතනයේ මග පෙන්වීම පරිදි විධිමත් පුහුණු පාඨමාලාවන් සකස් කිරීම සහ පෙර පාසල් පාලිකාවන් පුහුණු කිරීම,

(10) ප්‍රාථමික පාසල්වල විෂය මාලාවේ හා ද්විතීක අධ්‍යාපනය පිළිබඳ තෝරාගත් විෂයයවල ප්‍රාදේශීය වෙනස්කම් ඇති කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ උපදේශ අනුව කටයුතු කිරීම,

(11) ඉගැන්වීමේ ආධාර, දෘශ්‍යාධාර හා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ, ලී බඩු සහ වෙනත් උපකරණ සැපයීම හා බෙදා හැරීම,

(12) පාසල් ගොඩනැගිලි, පුස්තකාල, ක්‍රීඩා භූමි හා අධ්‍යාපනයට සම්බන්ධ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම සහ නඩත්තු කිරීම,

(13) රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සඳහන් කරන නිශ්චිත උපකරණ සමහරක් හැර, විද්‍යා උපකරණ ලබා ගැනීම සහ බෙදා හැරීම,

(14) ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් කරනු ලබන මග පෙන්වීම් අනුව පාසල් පුස්තකාල සංවිධානය කිරීම හා සංවර්ධනය කිරීම; සහ

(15) ඉහත සඳහන් වගකීම් සහ කාර්යභාරයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වියහැකි වෙනත් යම් කාර්ය ඉටු කිරීම.

අධ්‍යාපන අධ්‍යක්ෂට සිය බලතල පැවරිය හැකි බව.

6. (1) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ හෝ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරී ඇති බලතල හා කාර්යයන්ගෙන් ඕනෑම බලතලයක් හෝ කාර්යයක් ඔහු විසින් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ වෙනත් නිලධාරියෙකු වෙත පවරනු ලැබිය හැකිය.

(2) මෙම වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ බලතල පවරනු ලැබූ සෑම තැනැත්තෙකුම අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන විධිවිධානවලට යටත්ව එම බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

## II වැනි කොටස

පළාත් උපදේශක මණ්ඩල පිහිටුවීම.

7. (1) සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය මත අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ප්‍රවීණතාවයක් ලබා ඇති පුද්ගලයන් නව දෙනෙකුගෙන් යුත් පළාත් අධ්‍යාපන හා උපදේශක මණ්ඩලයක් (මෙහි මින්මතු, "මණ්ඩලය", යනුවෙන් හඳුන්වනු ලබන) සබරගමුව පළාත තුළ පිහිටුවනු ලැබිය හැකිය.

(2) විශ්ව විද්‍යාල, විද්‍යා පීඨ, කාර්මික විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන, පිරිවෙන්, සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යන ආයතනවලින් ද, භාෂා, ආගමික, සංස්කෘතික, යන අංශවලින් සහ ද්විධ මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු කෙරෙන ආයතනවලින් ද, පුද්ගලයන් නියෝජනය වන පරිදි, සාමාජිකයන් හත්දෙනෙකු ද (07), අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතුය.

(3) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි තවත්, සාමාජිකයන් දෙදෙනෙකු ද (02) පත් කරනු ලැබිය යුතුය.

(4) මෙම සාමාජිකයන් අතරින් එක් සාමාජිකයෙකු, එම පළාත් උපදේශක මණ්ඩලයේ සභාපති ලෙස අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධරයෙකු එහි ලේකම් ලෙස පත් කරනු ලැබිය යුතුය.

(5) පළාත් උපදේශක මණ්ඩලයේ ඕනෑම රැස්වීමකට සහභාගි වීමේ අයිතියක් අධ්‍යාපන අධ්‍යක්ෂට ඇති අතර, එම මණ්ඩලය විසින් අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවක දී එහි ඕනෑම රැස්වීමකට සහභාගි වීමට උපදේශක මණ්ඩලයේ නිර්දේශය මත වෙනත් ඕනෑම නිලධාරීන්ට ද ආරාධනා කිරීමේ අයිතියක් උපදේශක මණ්ඩලයේ සභාපතිවරයාට ඇත්තේය.

(6) පළාත් උපදේශක මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සහ ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය, බලතල හා විෂයය සීමාවන්, මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝග මගින් නියම කරනු ලැබිය හැක්කේය.

පළාත් උපදේශක මණ්ඩලයේ කාර්යයන්.

8. (1) අධ්‍යාපන විෂයයට හෝ අධ්‍යාපන පහසුකම් සපුරා දීමට අදාළ වන කටයුතුවල දී සහ අමාත්‍යවරයා විසින් යොමු කරනු ලබන කටයුතුවල දී අමාත්‍යවරයාට උපදේශ ලබා දීම පළාත් උපදේශක මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන්නේය.

(2) මෙම වගන්තියේ (1) වැනි උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාර්යයන්ට අමතරව, අධ්‍යාපන විෂයයට අදාළව පළාත් සභාව විසින් පනවනු ලබන යම් ප්‍රඥප්තියකින් පවරනු ලබන වෙනත් යම් කාර්යයන් ඉටු කිරීම ද උපදේශක මණ්ඩලයට කළ හැකිය.

පළාත් උපදේශක මණ්ඩලයේ කාලය, අස්වීම හා සහභාගීත්ව හැරයාම.

9. (1) පළාත් උපදේශක මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම, මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා කලින් ධුරය හිස් කළ හොත් මිස, පත් කරනු ලැබූ දිනයේ සිට වසර තුනක (03) කාලයක් ධුරය දැරිය යුතුය.

(2) පළාත් උපදේශක මණ්ඩලයේ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් සාමාජිකයෙකු ඉවත් කිරීම යෝග්‍ය බව අමාත්‍යවරයාගේ මතය වුවහොත් අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා එම ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(3) උපදේශක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට අමාත්‍යවරයා වෙත කරන ලිඛිත දැන්වීමකින් ඉල්ලා අස්විය හැක්කේය.

(4) කලින් දන්වා අවසර ලබා නොගෙන විදේශගත වීම හෝ කලින් දන්වා අවසර ලබාගෙන හෝ රෝගාතුර වීම නිසා හෝ, වෙනත් බොහෝ හෝ හේතුවක් හෝ මත ලිත් වර්ෂයක් තුළ පැවති රැස්වීම්වලින් නොකඩවා රැස්වීම් වාර තුනක් (03) සඳහා නොපැමිණි, ඕනෑම සාමාජිකයෙකු, එසේ නොපැමිණි දින සිට තම සාමාජිකත්වය අත්හැර ගියා සේ සලකනු ඇත.

(5) රෝගාතුර වීම හෝ නිවාඩු ලබා ගැනීම නිසා හෝ ස්වකීය ධුරයේ කාර්යයන් ඉටු කිරීමට යම් සාමාජිකයෙකුට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක දී, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තෙකු එම කාලය සඳහා පත් කිරීම අමාත්‍යවරයාට කළ හැකිය.

(6) යම් සාමාජිකයෙකු මිය යාම, ඉල්ලා අස් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ඇති වන පුරප්පාඩුවක් පිරවීම සඳහා, 07 වැනි වගන්තියෙහි (1) උපවගන්තියෙහි ඇති විධිවිධාන සැලකිල්ලට ගෙන, වෙනත් තැනැත්තෙකු අමාත්‍යවරයාට පත්කළ හැකි අතර, එසේ පත් කරනු ලැබූ තැනැත්තා තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතුය.

10. (1) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා වූ ගණ පූර්ණය සාමාජිකයන් තිදෙනෙකු (03) විය යුතුය. ගණ පූර්ණය සහ රැස්වීම් කාර්ය පටිපාටිය.

(2) සභාපතිවරයා පැමිණ සිටී නම්, මණ්ඩලයේ සෑම රැස්වීමකම ඔහු මූලසුන දැරිය යුතුය. සභාපතිවරයා රැස්වීමට පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින්, තමන් අතුරෙන් කෙනෙකු එම රැස්වීමේ මූලසුන දැරීම සඳහා තෝරා පත්කර ගත යුතුය.

(3) මණ්ඩලයේ සභාපති රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ තාවකාලික ලෙස තම තනතුරේ කටයුතු කිරීමට අපොහොසත්වන අවස්ථාවක දී, ඇමතිවරයා විසින් මණ්ඩලයේ වෙනත් සාමාජිකයෙකු, එම තනතුරේ කටයුතු ඉටු කිරීම සඳහා පත් කළ හැකිය.

11. අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, සබරගමුව පළාතේ පළාත් සභාවේ අනුමැතිය ඇතිව යම් ප්‍රමාණයක පාරිශ්‍රමිකයක් පළාත් උපදේශක මණ්ඩලයේ සියලු සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතුය. සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

12. (1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ යම් පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතවරයෙකු ලෙස ක්‍රියා කරන කවර පුද්ගලයෙකු වුව ද, පළාත් උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් නොකරනු ලැබිය යුතු වන්නේය. උපදේශක මණ්ඩලයට පත්වීමට නොහැකි පුද්ගලයින්.

(2) විකල් සිහියෙන් යුත් පුද්ගලයෙකු හෝ බංකොලොත් හෝ වස්තු භංගත්වයට පත් වූවෙකු බවට ප්‍රකාශයට පත් කරන ලද පුද්ගලයෙකු හෝ කවර අන්දමකින් හෝ විස්තර කෙරෙන සිර දඬුවමකට යටත් කළ හැකි, වරදක් කරන ලද බවට අධිකරණයක් විසින් විනිශ්චය කරනු ලැබූ පුද්ගලයෙකු පළාත් උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් නොකරනු ලැබිය යුත්තේය.

(3) රජයේ තනතුරක් දරන යම් පුද්ගලයෙකු සමගාමීව පළාත් උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට ඔවුන් විසින් තනතුරක් දරනු ලැබීම නුසුදුසුකමක් නොවිය යුත්තේය.

## III වැනි කොටස

### *පෙර පාසල් අධ්‍යාපනය හා විශේෂිත පාසල්*

13. වෙනත් යම් ප්‍රඥප්තියක විධිවිධානවලට යටත්ව පළාත තුළ පිහිටි පෙර පාසල් අධ්‍යාපනය සඳහා අවශ්‍ය පෙර පාසල් පාලිකාවන් හා ගුරුවරුන් පුහුණු කිරීම හා උපදේශාත්මක සේවා සැපයීම අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරන ලද අය විසින් කරනු ලැබිය යුත්තේය. පෙර පාසල් අධ්‍යාපනය.

14. (1) වෙනත් යම් ප්‍රඥප්තියක විධිවිධානවලට යටත්ව ක්‍රීඩා හා සෞන්දර්යය විෂයයන් සඳහාම වෙන් වූ පාසල් සහ ආබාධිතයින් හා වැඩිහිටියන් සඳහා වෙන් වූ පාසල් ආරම්භ කිරීමට අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද අය විසින් කටයුතු සැලැස්විය යුත්තේය. ඊට අමතරව ඒ සඳහා සාමාන්‍ය පාසල්වල අංශ ඇති කරනු ලැබිය හැක්කේය. ක්‍රීඩා හා සෞන්දර්යය විෂයයන් සඳහා පාසල්

(2) මෙම වගන්තියේ (1) වැනි උපවගන්තියෙහි කුමක් සඳහන් වුව ද එම උපවගන්තියෙහි සඳහන් අවශ්‍යතාවයන් සඳහා වෙන් වූ පාසල් ආරම්භ කිරීම වෙනුවට ඒ සඳහා හැකි අවස්ථාවන්හි දී සාමාන්‍ය පාසල්වල විශේෂ අංශ ඇති කිරීම වුව ද, දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබිය හැකිය.

(3) ආරම්භ කරන ලද වෙන් වූ පාසල්වල සහ පාසල්වල විශේෂ අංශ සඳහා තෝරා ගන්නා සිසුන්ට ඒ සඳහා අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව, ශිෂ්‍යාධාර සැපයීම අවශ්‍ය අවස්ථාවන්හි දී සිදුකළ හැක්කේය.

(4) මෙම වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ආරම්භ කරන ලද පාසල්වල සාමාන්‍ය අධ්‍යයන කාලය සංශෝධනය කිරීමට අමාත්‍යවරයාට බලය ඇති අතර, එම කාලය සාමාන්‍ය පාසලක ඉගැන්වීම කරනු ලබන පැය ගණනට සමාන විය යුත්තේය.

## IV වැනි කොටස

### පොදු විධිවිධාන

**අනිවාර්යය අධ්‍යාපනය.**

15. සබරගමුව පළාත තුළ පිහිටි පාසල් යාමට යුතු වයසේ සියලුම ළමුන් සඳහා එම පළාත තුළ පිහිටි රජයේ පාසල්වල, අනිවාර්ය අධ්‍යාපන අවස්ථාවන් සැලසීමට ක්‍රියා කිරීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වන්නේ ය.

16. වයස අවුරුදු පහකුත් (05), දහසයකුත් (16) අතර ළමයින්ට, අධ්‍යාපනය ලබාදීම සඳහා පාසල්වලට යොමු කිරීම එම ළමයින්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් සතු වගකීම වන්නේ ය.

**පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම.**

17. සබරගමු පළාතේ පාසලකට ළමයින් ඇතුලත් කිරීම සඳහා ඉල්ලුම් කරන කිසිදු අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයක්, එම අයදුම්කරුගේ හෝ එම අයදුම්කරුගේ දෙමාපියන් හෝ භාරකරුවන් හෝ ඔවුන්ගෙන් එක් අයෙකුගේ හෝ ආගම, ජාතිය, වර්ගය, කුලය, සමාජ තත්ත්වය හෝ භාෂාව මත, ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතුය. අයදුම්කරුවන්ගේ හෝ තම දෙමව්පියන්ගෙන් කෙනෙකුගේ හෝ ආගම හෝ ජාතිය හෝ වර්ගය හෝ කුලය හෝ සමාජ තත්ත්වය හෝ භාෂාව හෝ අනුව එවැනි අයදුම්කරුවෙකු සබරගමුව පළාතේ කිසියම් පාසලකට ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

**ආගම ඉගැන්වීම.**

18. (1) මෙහි මින් මතු දක්වා ඇති විධිවිධානවලට යටත්ව, පාසලක ඉගෙන ගන්නා සෑම ශිෂ්‍යයෙකුගේ දෙමව්පියන් හෝ භාරකරුවන් අදහන ආගම, එම ශිෂ්‍යයාට පාසලේ සාමාන්‍ය අධ්‍යාපන පටිපාටියේ කොටසක් වශයෙන් ඉගැන්විය යුත්තේ ය.

(2) පාසලක ආගමක් සම්බන්ධ ඇදහීමකට හෝ පුද පූජා පැවැත්වීමකට කිසිය යුතු කාලය, පාසල ආරම්භයේ දී, අවසානයේ දී නැතහොත් ආරම්භයේ හා අවසානයේ විය යුතු අතර, එම අදාළ කාලය නිශ්චිත වශයෙන්ම සටහන් කරන ලද කාල සටහනක් පාසලේ සෑම පන්ති කාමරයකම පැහැදිලිව ප්‍රදර්ශනය කළ යුතු වන්නේ ය.

**ශිෂ්‍යයෙකුගේ ආගම තීරණය කිරීම.**

19. ශිෂ්‍යයකුගේ ආගම කුමක්දැයි යන්න පහත දැක්වෙන විධිවිධානවලට අනුව තීරණය කරනු ලැබිය යුත්තේය :–

*(අ)* යම් ශිෂ්‍යයකුගේ පියෙකු මහා සිහි බුද්ධියෙන් යුතුව තම ආගම පිළිබඳ ප්‍රකාශයක් කරනු ලබන්නේ නම් එම ශිෂ්‍යයාගේ ආගම, එම ආගම බව සැලකිය යුත්තේ ය.

*(ආ)* (අ) ඡේදය යටතේ කරන ලද ප්‍රකාශයක් නැති විටක, ශිෂ්‍යයාගේ මව මහා සිහිබුද්ධියෙන් යුතුව තම ආගම පිළිබඳව ප්‍රකාශයක් කරනු ලබන්නේ නම්, එම ශිෂ්‍යයාගේ ආගම එම ආගම බව සැලකිය යුත්තේය.

*(ඇ)* (අ) සහ (ආ) ඡේද යටතේ ප්‍රකාශයක් නොමැති විටක, ශිෂ්‍යයාගේ නීත්‍යානුකූල භාරකාරත්වය දරන යම් තැනැත්තෙකු විසින් ශිෂ්‍යයාගේ ආගම ලෙස ප්‍රකාශ කරන ආගම, ශිෂ්‍යයාගේ ආගම ලෙස සැලකිය යුතු වන්නේ ය.

**පාසල්වලට ඇතුලත් කිරීමේ දී ගාස්තු අය නොකළ යුතු බව සහ පහසුකම් හා සේවා ගාස්තු.**

20. (1) පාසලකට ඇතුළත් කර ගැනීම සඳහා හෝ අධ්‍යාපනය ලබාදීම සඳහා, කිසිදු ගාස්තුවක් අය නොකළ යුතුය.

(2) මෙම වගන්තියේ (1) වැනි උපවගන්තියෙහි සඳහන් විධිවිධානයකට අගතියක් නොවන පරිදි, පාසලකට විෂය භාර හා විෂය සමගාමී ක්‍රියාකාරකම් හා සේවා පවත්වා ගැනීම සම්බන්ධයෙන් දරන්නට සිදුවන යම් වියදමක් පියවා ගැනීම සඳහා, සිසුන්ගෙන් පහසුකම් හා සේවා ගාස්තු ලෙස යම් මුදලක් අය කර ගැනීමට ඉඩකඩ සැලසීමට අවශ්‍ය රෙගුලාසි, මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබිය හැකි වන්නේ ය.

(3) පහසුකම් හා සේවා ගාස්තු වශයෙන් අය කරනු ලබන යම් මුදලක් ගෙවීමට නොහැකිවීම හේතු කොට ගෙන, පාසලකට ඇතුලත් නොකිරීම හෝ පාසලට නොපැමිණීම සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ට දඬුවම් කිරීම හෝ නොකළ යුතුය. එසේ දඬුවම් කිරීම වළක්වා ගැනීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම පාසල් විදුහල්පතිවරයාගේ වගකීම වන්නේය. අමාත්‍යවරයා විසින් හෝ පළාත් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් හෝ ඔවුන් විසින් බලය පවරනු ලබන වෙනත් ඕනෑම අයෙකු කිසියම් පාසලක ක්‍රියාකාරීත්වය, පාසලේ වත්කම් හෝ එහි ඇතුළත්ව පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

පෞද්ගලික නව පාසලක් හෝ උපකාරක පන්තියක් ආරම්භ කරන තැනැත්තන් ඒ බව අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු බව.

21. (1) *(අ)* පෞද්ගලික නව උපකාරක පන්තියක් හෝ පෞද්ගලික පාසලක් ආරම්භ කිරීමට හෝ යම් ගොඩනැගිල්ලක දී හෝ ඒ ඒ පාසල් යන වයසේ ළමයින්ට සිංහල, දෙමළ හෝ වෙනත් ඕනෑම භාෂාවකින් අධ්‍යාපනය ලබාදීම සඳහා පන්තියක් හෝ පන්ති පැවැත්වීම අපේක්ෂා කරන යම් තැනැත්තෙකු විසින්, එකී යෝජිත පාසල හෝ පන්ති පැවැත්වීම, ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් මාස දෙකකට (02) කලින්, ඒ පාසල හෝ පන්ති පිළිබඳ විස්තර ඇතුළත් ලිඛිත දැන්වීමක් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සැපයිය යුතු ය.

*(ආ)* මෙම නීතිය බලාත්මක වන දිනය වන විට සබරගමුව බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක උපකාරක පන්ති හා පෞද්ගලික පාසල් පිළිබඳ විස්තර ඇතුළත් ලිඛිත දැන්වීමක් මාස තුනක (03) කාලයක් ඇතුළත සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සැපයිය යුතුය.

(2) මෙම වගන්තියේ (1). (අ). සහ (1) (ආ) උපවගන්ති යටතේ සපයන ලද විස්තරවලට අමතරව, යෝජිත ඒ පාසල හෝ අධ්‍යාපන පන්තිය හෝ පන්ති සම්බන්ධයෙන් අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන වෙනත් විස්තර සැපයීම (1) වැනි උපවගන්තිය යටතේ දැන්වීම ඉදිරිපත් කරන තැනැත්තා සතු වගකීම වන්නේය.

(3) (අ) මෙම වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දෙනු ලැබූ දැන්වීමකට අදාළ යම් පාසලක් හෝ අධ්‍යාපන පන්තියක් හෝ පන්ති අනුමත කිරීම, අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඊට අදාළව මෙම ප්‍රඥප්තියේ 28 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලබන ප්‍රමිතීන් සැලකිල්ලට ගනිමින් අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකිය.

(ආ) ඉරිදා දිනයන්හි උදය වරුවේ පෙරවරු 8.00 සිට පස්වරු 2.00 දක්වාත්, පසළොස්වක පෝය දිනවලත් කිසිදු පෞද්ගලික පාසලක් හෝ උපකාරක පන්තියක් හෝ පැවැත්වීම නොකළ යුතුය.

(4) මෙම වගන්තියේ (1),(2),(3) උපවගන්තිවල විධිවිධාන කඩ කරමින් යම් පාසලක් ආරම්භ කරන හෝ යම් අධ්‍යාපන පන්තියක් හෝ පන්ති හෝ පවත්වන යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවෙකු වන්නේය.

පාසල් හා පරිශ්‍ර වෙනත් කටයුත්තකට නොගත යුතු බව.

22. පාසල් ගොඩනැගිලි, උපකරණ හා පාසල් පරිශ්‍ර, අධ්‍යාපනික, ක්‍රීඩා, සංස්කෘතික, පොදු කටයුතු හා ආගමික කාර්යයන් හැර, වෙනත් කටයුතු සඳහා යොදා නොගත යුතු අතර, එවැනි උපකරණයක් හෝ පාසල් පරිශ්‍ර ජාතික වැදගත්කමකින් යුතු වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීමට අවශ්‍ය වීටක දී, ඒ සඳහා අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය ලබා ගත යුත්තේය.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා යටතේ වන වත්කම්.

23. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී අධ්‍යාපන විෂයය ක්‍රියාත්මක කිරීම උදෙසා රජයෙන් හෝ පළාත් සභාවෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ ලැබූ යම් වත්කමක් හෝ දේපළක් එසේ එම විෂයය ක්‍රියාත්මක කිරීම සඳහා යොදවා තිබුණි නම්, ඒ සියල්ල මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට පැවරී ඇති වත්කම් හෝ දේපළ වශයෙන් සැලකිය යුතුය.

ප්‍රතිපාදන ලබා දීම.

24. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද ආයතනවල නඩත්තු කටයුතු උදෙසා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම හෝ වැය කිරීම කෙරෙහි, 1987 අංක 42 දරන පළාත් සභා පනත, අදාළ විය යුත්තේය.

වාර්ෂික පාලන වාර්තාව.

25. (1) වර්ෂය තුළදී පළාත තුළ අධ්‍යාපන කටයුතු පවත්වා ගන්නා ලද ආකාරය, පැන නැගුණු ගැටළු සහ එම ගැටළු විසඳීමට ගත් පියවර හා අධ්‍යාපනය පිළිබඳ උපනතීන් ගැන සඳහන් කෙරුණු වාර්ෂික පාලන වාර්තාවක් ඊට පසු වර්ෂයේ ජුනි මස 31 වැනි දිනට පෙර, අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතුය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද පාලන වාර්තාව අමාත්‍යවරයා විසින් මාස දෙකක (02) කාලයක් තුළදී පළාත් සභාවේ සභාගත කළ යුතුය.

අමාත්‍යවරයාට විධාන නිකුත් කිරීමට ඇති බලය.

26. (1) දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ එහි වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් විශේෂ හෝ සාමාන්‍ය හෝ විධාන අමාත්‍යවරයා විසින් දෙපාර්තමේන්තුවට කලින්කල ලිඛිතව දෙනු ලැබිය හැකි අතර, ඒ විධාන අනුව ක්‍රියා කිරීම දෙපාර්තමේන්තුව සතු කාර්යයක් වන්නේය.

(2) අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ කලින් කල දෙනු ලබන විධාන අනුව ක්‍රියා කිරීම අධ්‍යාපන අධ්‍යක්ෂ ඇතුළු මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරනු ලබන අනෙකුත් සියලු නිලධාරීන් සතු කාර්යය වන්නේය.

## V වැනි කොටස

### *වැරදි හා දඬුවම්*

වැරදි හා දඬුවම්.

27. (1) මෙම ප්‍රඥප්තිය හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ නිකුත් කරන ලද විධානයක්, කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ මෙම ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තෙකුට පැවරී ඇති කර්තව්‍යයන් ඉටු කිරීමෙහි ලා ඒ තැනැත්තාට හුවමනාවෙන්ම අවහිර කරන සෑම තැනැත්තෙකුම මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු

කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් (රු.1000/-) නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් (02) නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුත්තේ ය.

(2) එසේ වුව ද මෙම ප්‍රඥප්තිය යටතේ වන වරදකට යම් පුද්ගලයකු එක් වතාවකට වඩා වැරදිකරුවෙකු වන අවස්ථාවක දී රුපියල් පන්දහසක් (රු.5000) නොඉක්මවන දඩයකට සහ මාස හයක (06) බරපතල වැඩ සහිත සිර දඬුවමකට යටත්විය යුත්තේ ය.

නියෝග සෑදීම

28. (1) මෙම ප්‍රඥප්තියෙන් නියම කරනු ලැබූ හෝ නියෝග සෑදීමට බලය දී ඇති හෝ සියළු කාරණයන් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) මෙම වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ සාදන කරන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයේ නියමිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ ඒ නියෝගය ක්‍රියාත්මක වන්නේ ය.

(3) ඉහත (1) වැනි උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කල යුතු වන්නේය. පළාත් සභාව විසින් අනුමත නොකරන ලද යම් නියෝගයක් වේ නම් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි එම නියෝගය අනුමත නොකෙරන ලද දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

නිවාඩු දින ප්‍රකාශයට පත් කිරීම

29 හදිසි අත්‍යවශ්‍ය අවස්ථාවක දී පාසල් නිවාඩු දිනයක් ප්‍රකාශයට පත් කිරීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේ ය.

නිලධරයන් හා සේවකයන් රාජ්‍ය නිලධාරීන් බව

30. පළාත් දෙපාර්තමේන්තුවේ සියළුම නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සළකනු ලැබිය යුතු ය.

දෙපාර්තමේන්තුව අල්ලස් පනතේ අර්ථානුකූලව උප ලේඛන ගත ආයතනයක් බව

31. අල්ලස් පනතේ අර්ථානුකූලව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව සේරුම් ගනු ලැබිය යුතු ය.

32. මෙම ප්‍රඥප්තියෙහි "ආණ්ඩුකාරවරයා" යන්නෙන් සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වන්නේ ය.

33. මෙම ප්‍රඥප්තියෙහි "ප්‍රධාන අමාත්‍යවරයා" යන්නෙන් සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා අදහස් වන්නේ ය.

34. මෙම ප්‍රඥප්තියෙහි "අමාත්‍යවරයා" යන්නෙන් සබරගමුව පළාත් සභාවේ අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා අදහස් වන්නේ ය.

35. මෙම ප්‍රඥප්තියෙහි "ගැසට් පත්‍රය" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අදහස් වන්නේ ය.

36. මෙම ප්‍රඥප්තියෙහි "පළාත් සභා පාසල්" යන්නට ජාතික පාසල්, භික්ෂූන් වහන්සේලා සඳහා වූ පාසල් සහ නියමිත සංවර්ධන යෝජනා ක්‍රම සඳහා වූ පාසල් සහ නියමිත සංවර්ධන යෝජනා ක්‍රම සඳහා වූ පාසල් වන නියමිත පාසල් හැර සබරගමුව පළාත් සභා බලප්‍රදේශය තුළ පිහිටි සබරගමුව පළාත් සභාවට අයත් සියළුම පාසල් අදහස් වන්නේ ය.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

37. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වූවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

"සබරගමුව පළාත් සභාවේ 2010 අංක 01 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය" නැමති මෙම ප්‍රඥප්ති කෙටුම්පත 2010.05.06 වැනි දින පැවති සබරගමුව පළාත් සභාවේ සභා රැස්වීමේ දී යථා පරිදි සම්මත කරන ලද බව මෙයින් සහතික කරමි.

බී.ඒ. එම්. රංජිත් බණ්ඩාර,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

2010 ජූනි මස 14 වැනි දින
සබරගමුව පළාත් සභාවේ දී ය.

2010ක් වූ ජූනි මස 23 වැනි දින දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (උ) (3) වගන්තිය යටතේ අනුමැතිය දෙමි.

වී.ජ.මු. ලොකුබණ්ඩාර,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

07 - 564

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.